museum of modern
and contemporary art
sri lanka

PRESS RELEASE

2023 පෙබරවාරි

**MMCA ශ්‍රී ලංකා 'දෙවැනි වෙළුම' එළිදැක්වීම දැනුම් දෙයි**

ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය (MMCA ශ්‍රී ලංකා) එහි වත්මන් ප්‍රදර්ශනයවන 'අක්කර 88: මිනෙට් ද සිල්වා විසින් කළ වටපුළුව නිවාස යෝජනා ක්‍රමය' හා අනුයෑමට නිර්මාණයකර ඇති 'දෙවැනි වෙළුම' නම් කෞතුකාගාරයේ ඉදිරි ප්‍රකාශනය පිළිබඳව දැනුම් දෙන්නේ ඉතාමත් සතුටිනි. මෙම ප්‍රදර්ශනය, ශ්‍රී ලංකාවේ බහුවිධ වාර්ගික-ආගමික රාජ්‍ය සේවකයින් ප්‍රජාවකට දැරිය හැකි මිලකට නවාතැන් පහසුකම් ඇති නව යුගයක් පෙරමඟ දන්වමින්, පරිශීලකයන්ගේ සහභාගීත්වයෙන් නිර්මාණය කෙරුණු පෙරළිකාර සාමාජ නිවාසකරණ ව්‍යාපෘතිය කේන්ද්‍රකරගනියි.

MMCA ශ්‍රී ලංකා විසින් ප්‍රකාශිත 'දෙවැනි වෙළුම' කෞතුකාගාරයේ ප්‍රථම පර්යේෂණ ප්‍රකාශනය වන අතර එයට ලෝක ස්මාරක අරමුදල, බ්‍රිතාන්‍ය කවුන්සිලය, දකුණු ආසියා කලා ව්‍යාපෘතිය, සහ වීට්‍රා ඩිසයින් පදනම විසින් සහාය දක්වයි. 'දෙවැනි වෙළුම' 2024 පෙබරවාරි 10 වැනිදා කොළඹ 3, ක්‍රෙස්කැට් බූලෙවාඩ්හි බිම් මහලේ පිහිටි MMCA ශ්‍රී ලංකාහි එළිදැක්වේ. 'දෙවැනි වෙළුමෙහි' පිටපත් 2024 පෙබරවාරි 1 වැනිදා සිට පෙර-ඇණවුම් කිරීමට හැකිය. ප්‍රකාශනය පෙර-ඇණවුම් කිරීමට හෝ මිලදී ගැනීමට facebook.com/mmcasrilanka තුළින් කෞතුකාගාරයේ ෆේස්බුක් පිටුවට හෝ instagram.com/mmcasrilanka/ හරහා ඉන්ස්ටග්‍රෑම් පිටුවට පිවිසෙන්න. 'දෙවැනි වෙළුම' අලෙවියෙන් ලැබෙන සියලු ආදායම MMCA ශ්‍රී ලංකාහි 'අක්කර 88' ප්‍රදර්ශනයේ ත්‍රෛභාෂික අධ්‍යාපන හා මහජන වැඩසටහන්වලට සහාය වීමට යොමු කරනු ලැබේ.

'දෙවැනි වෙළුම' එළිදැක්වීම පිළිබඳව කතා කරමින් MMCA ශ්‍රී ලංකාහි ප්‍රධාන අභිරක්ෂක හා 'දෙවැනි වෙළුමෙහි' සංස්කාරක ශාර්මිණී පෙරේයිරා පැවසුවේ, "මිනෙට් ද සිල්වා ශ්‍රී ලංකාවේ ප්‍රථම වාස්තු විද්‍යාඥවරිය ලෙස සැලකෙන අතර ඇය පුරෝගාමී නූතන වාස්තු විද්‍යාඥවරියක්. ඇයගේ කාර්යය ඉතා සමීප අවධානයකට ලක්විය යුතු අතර අප මෙතෙක් කළ අපගේ පර්යේෂණ පොතක ආකෘතියකින් සම්පාදනය කර තිබෙන්නේ එය වඩාත් පුළුල්ව ප්‍රචලිත කරනු පිණිසයි" යනුවෙනි. ප්‍රකාශනය සඳහා තමන්ගේ සහාය පිළිබඳව කතා කරමින් ලෝක ස්මාරක අරමුදලෙහි ව්‍යාපෘති අධ්‍යක්ෂ ජෝන් ඩාලින්ටන් පැවසුවේ, "මිනෙට් ද සිල්වා අන්තර්ජාතික පිළිගැනීමකට පාත්‍ර විය යුතුයි. ගොඩනැගිලි ඇතුළත් ඇයගේ උරුමයට හා වාස්තු විද්‍යාව සඳහා ඇයගේ ප්‍රවේශය වර්තමානයේ සැබවින් ම අනුනාද වෙනවා. උපදේශන පිළිබඳ මිනෙට්ගේ අදහස්, ඇය දේශීය ද්‍රව්‍ය, ශිල්පීන්, හා කලාකරුවන් භාවිතා කළ ආකාරය, සහ වාස්තු විද්‍යාව ස්ථානගත කිරීමේ ඇයගේ මෙහෙයුම යනු ඇයගේ මව්බිම වන ශ්‍රී ලංකාවෙන්

Groundfloor, Crescat Boulevard
89 Galle Road
Colombo 03

Registered Address:
117 Sir Chittampalam A. Gardiner Mawatha
Colombo 02
Sri Lanka

info@mmca-srilanka.org
www.mmca-srilanka.org

ඔබ්බිට ගිය වැඩි වැඩියෙන් අදාළ වන තේමා වෙනවා" යනුවෙනි. ඔහු තව දුරටත් කියා සිටියේ. "'දෙවන වෙළුමෙහි' ප්‍රකාශනය සඳහා ලෝක ස්මාරක අරමුදල විසින් MMCA ශ්‍රී ලංකාවට සහාය වෙන්නේ ඉහමත් සතුටින්. තවත් බොහෝ මිනිසුන් මිනෙට් පිළිබඳව දැනගත යුතුයි. මෙම ප්‍රකාශනය ඇය ගැන දනුවත්බව පැතිරවීමට උපකාර කරන අතර ඇගේ උරුමය දිගට ම පවතින බව සහතික කරනවා" යනුවෙනි.

ඉරුෂි තෙන්නකෝන්, සුමේධ කැලේගම, හා සුමුදු අතුකෝරල යන සමකාලීන කලාකරුවන්ගේ 'is this an architectural documentary?' (2023) නම් සජීවීකෘත වාර්තා චිත්‍රපටයෙහි පිටපත ඇතුළත් ප්‍රාථමික පර්යේෂණය හා මීට පෙර ප්‍රකාශිත නොවූ ආකයිව ද්‍රව්‍ය 'දෙවැනි වෙළුම' එකට එක් කරයි. තව ද, පෙරේයිරා විසින් කළ විශේෂයෙන් පැවරුණු රචනාවක් සමඟ වාස්තු විද්‍යාඥයින් වන කැලේගම හා අතුකෝරල විසින් කළ වටපුළුව නිවාස යෝජනා ක්‍රමය සඳහා ද සිල්වා නිර්මාණය කළ නිවාස දර්ශවාද පහක මැනුම් සැලසුම් ද එහි ඇතුළත් ය. 1966දී ශ්‍රී ලාංකික වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනය විසින් පළමුව ප්‍රකාශයට පත් කළ 'Experiments in Modern Regional Architecture in Ceylon 1950 to 1960' (1965–1966) නම් ද සිල්වාගේ මුඛ්‍ය රචනාවෙහි විශේෂ අතිරේකයක් ද 'දෙවැනි වෙළුමෙහි' ඇතුළත් ය.

ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය කවුන්සිලයෙහි අධ්‍යක්ෂ ඔර්ලන්ඩෝ එඩ්වර්ඩ්ස් පැවසුවේ, "'අක්කර 88' නම් වර්තමාන ප්‍රදර්ශනය සමඟ අනුයන MMCA ශ්‍රී ලංකාහි ප්‍රථම පර්යේෂණ ප්‍රකාශනය වන 'දෙවැනි වෙළුමට' අප සහාය ලබා දෙන්නේ ඉතාමත් සතුටින්. මිනෙට් ද සිල්වාගේ කාර්යය ප්‍රගතශීලී එකක් වන අතර ඇය වස්තු විද්‍යාඥයන් පරම්පරා ගණනාවකට ආභාෂය හා අනුප්‍රාණය ලබා දුන්නා" යනුවෙනි. ඔහු තවදුරටත් කියා සිටියේ, "ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ඊළඟ පරපුරට වගකීම් සහගත, සලකා බැලූ, හා සානුකම්පිත නිර්මාණ සැලසුම්කරණ සම්ප්‍රදායේ ඉදිරියට යාම සඳහා මෙම ප්‍රකාශනය දැනුමක් මෙන් ම දිරියක් ලබා දෙනු ඇතැයි අප බලාපොරොත්තු වෙනවා" කියා ය.

ද සිල්වාගේ අභාවයෙන් පසු ප්‍රකාශිත 'The Life and Work of an Asian Woman Architect Vol. 1' (1998) යන ස්වයං චරිතාපදානය සමඟින් ඇය පටන්ගත් අකයිව ක්‍රියාවලිය 'දෙවැනි වෙළුම' දිගට ම කරගෙන යයි. ප්‍රමාණයෙන් සමාන වන මෙම වෙළුම, එයට වෙනස්ව, වටපුළුව නිවාස යෝජනා ක්‍රමය නම් එක් ව්‍යාපෘතියක් පමණක් කේන්ද්‍ර කරගෙන ඇත්තේ ඇයගේ සුවිශේෂී ව්‍යවහාරයේ එක් එක් ව්‍යාපෘති වෙන ම හදාරන අනාගත වෙළුම්වල අපේක්ෂාව උදා කරමිනි. තමාගේ කාලයට අවුරුදු 70ක් පමණ ඉදිරියෙන් සිටිමින් දේශීය ද්‍රව්‍ය භාවිතය පිළිබඳව ද සිල්වා පෙන්වා දුන් වැදගත්කම පිළිඹිබු කරමින් 'දෙවැනි වෙළුම' කිසිදු කඩදාසි නාස්තියකින් තොරව දේශීයව තිබෙන කඩදාසි තොගවලින් මුද්‍රණය කර ඇත.

දකුණු ආසියා කලා ව්‍යාපෘතියෙහි (ASAP) විධායක අධ්‍යක්ෂ නුර් අස්ලම් පැවසුවේ, "'දෙවැනි වෙළුම' ප්‍රකාශයට පත් කිරීමට අඩ වශයෙන් අරමුදල් සැපයීමට ලැබීම ගැන දකුණු ආසියා කලා ව්‍යාපෘතිය ආඩම්බර වෙනවා. MMCA ශ්‍රී ලංකා යනු ASAP සඳහා පළමු ශ්‍රී ලාංකික ප්‍රතිපාදන සහකාරක පමණක් නොව, මෙය අප සහාය ලබාදුන් පළමු කෞතුකාගාර ප්‍රකාශනය ද වෙනවා. දකුණු ආසියානු නූතන හා සමකාලීන කලාවට දායක වීමේදී සාහිත්‍යය හා ප්‍රකාශන අපට වැදගත් සාධක වෙනවා" යනුවෙනි. "ශ්‍රී ලාංකික කලා ඉතිහාසවල ආඛ්‍යානය පිළිබඳ තවදුරටත් හඬ නැඟීමේදී ක්ෂේත්‍රයේ ප්‍රමුඛව සිටින ශාර්මිණී පෙරේයිරාගේ දැක්ම යටතේ එන MMCA ශ්‍රී ලංකාහි අනර්ඝ

කණ්ඩායමෙන් මෙම ව්‍යාපෘතිය ලැබීමට අප භාග්‍යවන්තයි” යැයි ඇය තවදුරටත් පැවසී ය.

‘දෙවැනි වෙළුම බැංගලෝර්හි වෙසෙන නියා තන්ඩපානි විසින් නිර්මාණයකර ඇති අතර ශ්‍රී ලංකාවේ මුද්‍රණය කරන ලදි. MMCA ශ්‍රී ලංකාහි සංස්කාර සහායක කෞමදී ජයවීරගේ සහයෙන් පෙරේයිරා විසින් මෙම කෘතිය සංස්කරණය කර ඇත.

ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය (MMCA ශ්‍රී ලංකා) යනු සාමාන්‍ය ජනතාව, පාසල්, මෙන් ම සංචාරකයන්ගේ ද ප්‍රයෝජනය හා රසවින්දනය සඳහා නූතන සහ සමකාලීන කලා කෘති ප්‍රදර්ශනය, පර්යේෂණය, රැස්කිරීම, සහ සංරක්ෂණය වෙනුවෙන් කැප වූ පොදු කෞතුකාගාරයක් පිහිටුවීම අරමුණු කරගත් අධ්‍යාපනය පෙරටුකරගත් මුලපිරීමකි. MMCA Sri Lanka කොළඹ 3, ක්‍රෙස්කැට් බූලෙවාඩ්හි පිහිටා ඇති අතර, දිනපතා පෙ.ව. 10 සිට ප.ව 6 දක්වාත්, සිකුරාදා ප.ව. 8 දක්වාත්, විවෘත ය. කෞතුකාගාරයේ මහජන වැඩසටහන්වල සියලු උත්සව නොමිලේ පැවැත්වේ.